**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

*දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021

මාර්තු - 2024

**BMGT E2065 - සංවිධාන න්‍යාය හා සැකැස්ම**

ප්‍රශ්න සංඛ්‍යාව : හතයි (07) කාලය: පැය 03 යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න අංක එක (01) අනිවාර්ය** වන අතර තවත් **ප්‍රශ්න** හතරකට **(04)** පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න අංක 01**

1. හොඳින් ස්ථාපිත ඉලෙක්ට්‍රොනික සමාගමක් වන ABC ඉලෙක්ට්‍රොනික්ස් සමාගම, එහි වේගවත් බව, නවෝත්පාදනය සහ සමස්ත නිෂ්පාදන ක්‍රියාකාරීත්වය වැඩි දියුණු කිරීම සඳහා සැලකිය යුතු ආයතනික පරිවර්තනයකට ලක් කිරීමට තීරණය කර ඇත. සමාගම සාම්ප්‍රදායික ශ්‍රිතීය ආයතනික ව්‍යුහයක් අනුගමනය කර ඇති නමුත් වෙළඳපොලේ ගතික වෙනස්කම් සමඟ වඩාත් සාර්ථක ආයතනික ව්‍යුහයකට මාරුවීමේ අවශ්‍යතාවයක් පවතී.

   අරමුණු:

   - ✓ පාරිභෝගික කේන්ද්‍රී ප්‍රවේශයක් ලබා ගැනීම
   - ✓ අන්තර් දෙපාර්තමේන්තු සහයෝගීතාවය සහ සන්නිවේදනය වැඩි දියුණු කිරීම.
   - ✓ නව නිෂ්පාදන සඳහා වෙළඳපොළ වේගවත් කිරීම.
   - ✓ සමස්ත නිෂ්පාදනයේ ගුණාත්මකභාවය සහ නවෝත්පාදනය වැඩි දියුණු කිරීම.

ABC ඉලෙක්ට්‍රොනික්ස් සමාගම මූලික නිෂ්පාදන රේඛා තුනක් හඳුනාගෙන ඇත: ස්මාර්ට් ෆෝන්, ස්මාර්ට් හෝම් උපාංග සහ ශ්‍රවණ පර්යන්ත (smartphones, smart home devices, and audio peripherals).

වර්තමාන ව්‍යුහයට පර්යේෂණ සහ සංවර්ධන, අලෙවිකරණය සහ නිෂ්පාදන සඳහා වෙනම දෙපාර්තමේන්තු ඇතුළත් වේ. සමාගම ප්‍රතිව්‍යුහගත කිරීම වඩාත් විධිමත් සහ ප්‍රතිචාරාත්මක සංවිධානයක් ඇති කරන බව නායකත්වය විශ්වාස කරයි.

ABC සමාගම සඳහා වඩාත් සුදුසු ආයතනික ව්‍යුහයක් යෝජනා කරන්න. යෝජිත ආයතනික ව්‍යුහය ඇඳ එම ව්‍යුහය තෝරාගැනීමට හේතු වූ සාධක පැහැදිලි කරමින් ඔබගේ පිළිතුර තාර්කිකව විමසන්න.

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 02**

අ) සංවිධාන ව්‍යුහය තීරණය කිරීමේදී සැලකිල්ලට භාජනය වන්නා වූ සංවිධානාත්මක ව්‍යුහ මානයන් (structural dimensions) පහක් (05) ලැයිස්තු ගත කර කෙටියෙන් එම මානයන් පැහැදිලි කරන්න.

(05 ලකුණු)

ආ) නිෂ්පාදන පද්ධතිය මත පදනම් වූ වුඩ්වර්ඩ් ගේ වර්ගීකරණය (Woodward' s classification) පැහැදිලි කර එම වර්ගීකරණයට අනුව ඉදිරිපත් කර ඇති මූලික තාක්ෂණයන් පිළිබඳව විමසන්න.

(15 ලකුණු)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 03**

අ) ආයතනික **"සහයෝගීතා ජාල"** අන්තර් සංවිධාන සබැඳියාව වර්ධනය කිරීමට බලපාන්නේ කෙසේද යන්න උදාහරණයක් සමගින් පැහැදිලි කරන්න.

(10 ලකුණු)

ආ) අන්තර්ජාතිකකරණයේදී සංවිධාන අනුගමනය කරන අන්තර්ජාතික සංවිධාන ව්‍යුහයන් දෙකක් (02) පිළිබඳව උදාහරණ සමගින් සාකච්ඡා කරන්න.

(10 ලකුණු)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 04**

අ) ආයතනයක් එහි පරිහානී අදියරයට පැමිණීමට හේතු වන්නා වූ සාධක පහක් (05) ලැයිස්තුගත කරන්න.

(05 ලකුණු)

ආ) ආයතනික ජීවන චක්‍රය යන සංකල්පය පැහැදිලි කර, එක් එක් අදියරට සම්බන්ධ ප්‍රධාන ලක්ෂණ ඉස්මතු කර දක්වන්න. ඔබගේ පිළිතුර පැහැදිලි කිරීම සඳහා සුදුසු උදාහරණ සමගින් ආයතනික ජීවන චක්‍රයෙහි අදියරයන් පැහැදිලි කරන්න.

(15 ලකුණු)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 05**

අ) විවිධ බල මූලාශ්‍ර භාවිතා කිරීමෙන් කළමනාකරුවන්ට පුද්ගල හැසිරීම් සහ ආයතනික ප්‍රතිඵලවලට බලපෑම් කළ හැකිය. බල ප්‍රභවයන් පහක් (05) භාවිතා කරමින්, කළමනාකරුවන්ට ශ්‍රී ලාංකීය සංවිධානවල කාර්යක්ෂමතාව වැඩිදියුණු කළ හැකි ආකාරය සාකච්ඡා කරන්න.

(12 ලකුණු)

ආ) "සංවිධාන දේශපාලනය සැමවිටම සේවකයන්ට සහ සංවිධානයට සෘණාත්මක ප්‍රතිඵල ඇති කරයි. ආනුභවික සහ ප්‍රායෝගික හේතු මත ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න.

(08 ලකුණු)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 05**

අ) විවිධ ආකාරයේ ආයතනික ගැටුම් අවධාරණය කරමින් ආයතනික ගැටුම් පිළිබඳ සංකල්පය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ) ආයතනික ගැටුම්හි ධනාත්මක මෙන්ම සෘණාත්මක බලපෑම් ද ඇත. මෙම ප්‍රකාශය ඇගයීමට ලක් කර ඔබේ පිළිතුර තහවුරු කිරීම සඳහා උදාහරණ භාවිතා කරන්න.

(10 ලකුණු)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 07**

අ) අභ්‍යන්තර හා බාහිර ආයතනික පරිසරය පැහැදිලි කර සංවිධාන කෙරෙහි එහි බලපෑම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ) "සංවිධාන තුළ නිවැරදි පරිසරයක් නිර්මාණය කිරීම සඳහා කළමනාකරුවන් ආයතනික සංස්කෘතියේ වැදගත්කම අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍ය වේ." විවිධ සංස්කෘති වර්ග විස්තර කර සංස්කෘතියේ වාසි සහ අවාසි ඉස්මතු කරමින් මෙම ප්‍රකාශය විවේචනාත්මකව ඇගයීමට ලක් කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**